පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජුලි මාසය 01

ශ්‍රේණිය - 9

ර/කරවිට මධ්‍ය විද්‍යාලය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

Weekly School Department of Education, Sabaragamuwa Province

නිපුණතාවය - පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.

නිපුණතා මට්ටම - ස්වාභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

ක්‍රියාකාරකම් - ශබ්දකෝෂයක් ඇන්තූරියම් පැලයක් සහිත පෝච්චියක් සහ 45cm x 45 cm රෙදි කැබැල්ලක් සම්පිණ්ඩනය කර චිත්‍රණය කරමු.

පැවරුම - පහත පියවර අනුව ක්‍රියාකාරකමෙහි නියැලෙන්න.

පියවර (1) - ඔබ නිවසේ ඇති. ඉහත සඳහන් ද්‍රව්‍යයන් සපයා ගන්න

පියවර (2) - එම සපයාගත් ද්‍රව්‍යයන් අතට ගෙන හොඳින් ඒවායේ හැඩය, මතුපිට ස්වභාවය, සෑදී ඇති මාධ්‍ය, ඝනත්වය, ප්‍රමාණය හා එකිනෙකට සාපේක්ෂව විශාලත්වය ආදිය හොඳින් අධ්‍යයනය කරන්න.

පියවර (3) - එම ද්‍රව්‍යයන් ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් ආකාරයට ඇස් මට්ටමින් සුදුසු ආධාරකයක් මත තබා මීටර් 2 පමණක් දුරින් ඔබ ස්ථානගත වී ඔබට පෙනෙන පරිදි මූලික සටහන අඳින්න.

පියවර (4) - ඇඳගත් මූලික සටහන ඉදිරියේ ඇති ද්‍රව්‍ය දෙස බලමින් පැන්සලෙන් එළිය අඳුර යොදමින් ඝනත්වය ත්‍රිමාණ බව පර්යාවලෝකනය මතුපිට ස්වභාවය පරිමාණය මතුවන පරිදි මූලික සටහන සම්පූර්ණ කරන්න.

පියවර (5) - මූලික සටහනට අනුව නැවත දළ සැලැස්මක් ඇඳ ඔබගේ වර්ණ මාධ්‍යයෙන් ඉහත සිද්ධාන්ත මතුවන පරිදි වර්ණ කරන්න (විවිධ වර්ණ මාධ්‍යයන් හසුරවන ආකාරය යූටියුබ් පරිශීලනය කරන්න)